## ආබාධිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාව

### 1. මූල්‍ය ප්‍රකාශන

#### 1.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව ආබාධිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ආබාධිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ කයාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

#### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

##### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණය කෙරේ.

සමාලෝචිත වර්ෂයට අදාල වෛද්‍යාධාර රු. 235,637 ක් උපචිත වියදම් ගිණුම්වල දක්වා නොතිබුණි.

##### 1.2.2 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | 1999 පෙබරවාරි 26 දිනැති අංක 2/1999 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | 8,504 | ජංගම දුරකථන සඳහා හිමිකම් නොමැති නිලධාරියෙකු වෙනුවෙන් දුරකථන වියදම් දරා තිබුණි. |
| (ආ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | |
| | (i) 5.1.3 වගන්තිය | | අනුමත කරන ලද අයවැය ලේඛනයේ පිටපතක් අදාල ගිණුම් වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර විගණකාධිපති වෙත යොමු කල යුතු වුවද එසේ කර |

| | | | |
|---|---|---|---|
| | | | නොතිබුණි. |
| (ii) | 5.2.1 වගන්තිය | | අදාල ආයතනයේ අයවැය ලේඛනය සමඟ වර්ෂය අවසානයට අයවැයගත ශේෂ පත්‍රය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශයන් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) | ආයතන සංග්‍රහය IXපරිච්ඡේදයේ 1.2 වගන්තිය. | 34,324 | නිලධාරියෙකුට වැටුපෙන් 1/6 දීමනාවක් ගෙවීම සම්බන්ධයෙන් ආයතන අධ්‍යක්ෂකගේ පූර්ව අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය සමාලෝචනය

#### 2.1.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වැඩ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු. 6,222,700 ක අතිරික්තයක් වූ අතර, ඉකුත් වර්ෂයේ ඊට අනුරූපව රු. 27,241,445 ක අතිරික්තයක් විය. මේ අනුව ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 21,018,745 ක පිරිහීමක් පෙන්නුම් කෙරේ. සුපිරි වාසනා ලොතරැයි ආදායම, ලෝක සෞඛ්‍ය සංවිධාන ආධාර, ක්‍රිස්තියානි ළමා අරමුදල් ආධාර වශයෙන් එකතුව රු. 25,097,182 කින් අඩුවීම සහ වෛද්‍යාධාර සැපයීම, ස්වයං රැකියා ආධාර සැපයීම, නිවාස ආධාර වශයෙන් එකතුව රු. 12,037,114 කින් වැඩිවීම මෙයට හේතු වී තිබුණි.

#### 2.1.2 මූල්‍ය පාලනයේ දුර්වලතා

සමාලෝචිත වර්ෂය අවසානයට බැංකු ගිණුමේ ශේෂය රු. 36,164,116 ක් වූ අතර, වර්ෂය තුල මාසික සාමාන්‍ය මුදල් ඉතිරිය රු. 18,711,631 විය. ඒ අනුව අතිරික්ත මුදල් ඵලදායි ආයෝජනයක යොදවා නොතිබුණි.

### 2.2 මෙහෙයුම් සමාලෝචනය

#### 2.2.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) ආබාධ සහිත තැනැත්තන්ට ප්‍රවේශ විය හැකි ආකාරයට ගොඩනැගිලිවල වෙනස් කිරීම සඳහා වූ ඉලක්කගත කාලය වූ වසර 08 න් වසර 04 ක් ඉක්මවා තිබුණද වැඩ සටහන

ක්‍රියාත්මක කිරීමට ක්‍රමවත් වැඩ පිළිවෙලක් පිළියෙල කර ඒ අනුව ක්‍රියාකාරී සැලැස්ම සකස් කර නොතිබුණි.

(ආ) අඩු ආදායම්ලාභී ආබාධ සහිත දරුවන් සඳහා අධ්‍යාපන ආධාර ලබාදීමේ වැඩ සටහන යටතේ දිස්ත්‍රික්ක 06 ක දරුවන් 13 දෙනෙකු පමණක් ආධාර ඉල්ලුම්කර තිබුණු අතර, දිස්ත්‍රික්ක 18 ක් වර්ෂ 02 ක පමණ කාලයක් තුල ආධාර ඉල්ලා නොතිබුණ බැවින් මෙම වැඩ සටහන පිළිබඳව ප්‍රමාණවත් දැනුවත් කිරීමේ ක්‍රියාවලියක් සිදුවී නොතිබුණි.

### 2.2.2 කාර්ය සාධනය

2010 වර්ෂයේ ආබාධිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ කාර්ය සාධනයේ මූල්‍ය හා භෞතික ප්‍රගතිය පහත පරිදි විය.

| | සැලසුම්ගත කාර්යයන් | සැලසුම්ගත වියදම් | භෞතික කාර්ය සාධනය | මූල්‍ය කාර්ය සාධනය |
|---|---|---|---|---|
| | | රු. | | රු. |
| නිවාස ආධාර - පුද්ගලයින් | 600 | 60,000,000 | 1314 | 62,671,786 |
| ආධාරක උපකරණ | - | 4,448,000 | 29118 | 4,927,350 |
| ජාත්‍යන්තර ආබාධිත දිනය | - | 625,700 | 01 | 503,930 |
| ප්‍රවේශ පහසුකම්- ගොඩනැගිලි | 18 | 1,647,000 | 17 | 1,647,324 |
| ලෝක සෞඛ්‍ය සංවිධානය | - | - | - | 1,534,568 |
| සංඛ්‍යාලේඛණ එකතු කිරීම හා පුහුණු වැඩ සටහන | - | 210,000 | 02 | 219,529 |

## 3. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ජාතික සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය.

(ආ) වැය ලෙජරය පවත්වාගෙනයාම.

(ඇ) ආදායම් ඇස්තමේන්තු

(ඈ) නිවාස ආධාර ගෙවීම්